# A SOCIOLOGICAL STUDY OF THE SOCIOECONOMIC PROBLEMS FACED BY WOMEN PLANTATION WORKERS

**Wimalarathne M.P.M.S. [1], Balasooriya B.A.G.D. H.[2]**
[1,2] University of Ruhuna, Sri Lanka

## ABSTRACT

Clonies in the early 19 th century. During the regime, the people who migrated from South Asia as laborers and settled in this country are the plantation community.Within that community, plantation women are a group that makes a significant to the county's economy.the aim of this research, which examines the social and economic problems faced by women plantation workers,is to gain an understanding of the social and economic problems faced by women plantation workers and their nature.Yatideriya watta in the upper newsmeyar grama sewa division of bulathkohupitiya divisional secretariat in the kegalle district was selected as the study area and 15 working women living there selected through random sampling methods.In-depeth interview and observation were the data collection methods.data was analysed through thematic analysis according to a qualitative research approach.women plantation workers were identified as the group most affected by the extreme poverty prevailing in the plantation community.they are deprived of basic needs,quality health services, freedom and leisure.diseases such as malnutrition were illnesses associated with their lives.the labour of the plantation women does not receive proper monetary valuation or value.their data revealed the inequality in pay for equal hours ofwork on gender difference. In some cases, women estate workers face challengers in securing land and property right.empirical data proved that a maturity of women are subjected two domestic violence on a daily basis.it was revealed that a majority of marriage women a blamed for the attacks.also in the plantation society, the right of women to make decision is very low compared to men.opportunities for independent for women in plantation household are very rare. In plantation community and Labour Union's , pattern of limited representation women in decision making actions was also discernible.it can be concluded that the women plantation workers face the aforementioned socio -economy problems, and these problems a difficult to eliminate through them, And it can be cancelled then sender in inequality acts as an invisible hand in the plantation society to cause and intensify these problems.

**KEYWORDS:** women plantation workers, plantation community, gender inequality, social inequality, domestic violence

**හැඳින්වීම**

ශතවර්ෂ දෙකකට ආසන්න ඉතිහාසයකට උරුමකම් කියනු ලබන ශ්‍රී ලංකාවේ වැවිලි ප්‍රජාවගේ මූලාරම්භය මෙරට බ්‍රිතාන්‍ය යටත් විජිත යුගයක්ව පැවති සමය දක්වා දිවයයි. බ්‍රිතාන්‍යයන් වර්ෂ 1840 දී කඳුකරයේකෝපි වගාවට කම්කරුවන් දකුණු ඉන්දියාවෙන් ගෙන්වූ අතර එම පිරිස කෝපි වගාව විනාශවීමෙන් අනතුරුව ඇති කළ තේ හා රබර් කේන්ද්‍ර කරගෙන ජන කොට්ඨාසයක් ලෙස වර්ධනය විය. ලයින් කාමර ආදිය තුළ ඉතා දිළිඳු කම්කරු ජීවිතයක් ගත කළ මොවුන් අනෙකුත් පිරිසට වඩා කැපී පෙනෙන සමාජ විෂමතාවයන්ගෙන් යුක්ත පිරිසක් විය. මේ අනුව ශ්‍රී ලංකාව තුළ මුළු ජනගහනයෙන් 5%ක් පමණ වතුකම්කරු ජනතාව නියෝජනය කරනු ලබයි. වැවිදි අංශයේ ආශ්‍රිතව මිලියනයක් පමණ වන ජනගහනයක් සෘජුව හා වක්‍රව එම ක්ෂේත්‍රයේ නියැලෙන අතර ඔවුන්ට එකදු බිම් අඟලකවත් හිමිකාරීත්වයක් නොමැත.මේ අතර කැපී පෙනෙන පිරිසක් ලෙසට වතුකම්කරු කාන්තාව ද හඳුනාගත හැකිය. මෙම වතුකර ප්‍රජාව විශේෂයෙන්ම මධ්‍යම, ඌව, සබරගමු සහ දකුණු පළාත් නියෝජනය කරනු ලබන අතර කළුතර, මහනුවර, මාතලේ, නුවරඑළිය, ගාල්ල, මාතර, බදුල්ල, මොණරාගල, රත්නපුරය හා කෑගල්ල වැනි දිස්ත්‍රික්ක ආශ්‍රිතවද වතු ප්‍රදේශයන්හි ව්‍යාප්තව සිටියි. මෙම දිස්ත්‍රිකයන්හි මුළු ජනගහනය මිලියන 9ක් පමණ වන අතරඉන් මිලියනයකට ආසන්න ප්‍රමාණයක් වැවිලි ප්‍රජාව වේ.එය එම දිස්ත්‍රික්කයන්හි මුළු ජනගහනයෙන් 11%ක් පමණ වන ඉහළ අගයක් ගනියි.

අතීතයේ සිට වර්තමානය දක්වා ශ්‍රී ලංකාව විදේශ විනිමය අත්කර දුන් වතුකම්කරුවන්ගේ වතුකරය තුළවරින් වර ක්‍රියාත්මක වූ ව්‍යුහාත්මක වෙනස්කම් නිසාඒවායේ හිමිකාරීත්වය මෙන්ම කළමනාකාරිත්වයද වෙනස්කම් වලට භාජනය විය.මෙම වෙනස්කම් වතුකරයේ පරම්පරා ගණනාවකටම බලපාන ලදී. වතුකර කාන්තාව යනු මෙරට ආර්ථිකයට ඉහළ දායකත්වයක් සපයනු ලබන පිරිසකි. ඔවුන්ද මෙහිදී ඉතා වැදගත් භූමිකාවක් ඉටු කරයි. "වතුකම්කරුවන් යම් ආකාරයකට පීඩාවට ලක් කරමින් මුල් කාලයේ තිබූ ආර්ථික ක්‍රමය වෙනස් කිරීමට වතු ජන සතුකරනය, ඉඩම් ප්‍රතිසංස්කරණය මෙන්ම 1977 දී හඳුන්වා දුන් විවෘත ආර්ථික ක්‍රමයද හේතු විය."(හේමන්ත, එන්.1980). ඉඩම් ප්‍රතිසංස්කරණ වලට පෙර වතුවල පාලකයන් වූයේ බ්‍රිතාන්‍ය ජාතිකයෝය.නමුත් අනතුරුව සිංහලයන් වතුවල ප්‍රධානීන් වීමත් සමඟ වතුකම්කරුවන්ගේ අධ්‍යාපනය, සෞඛ්‍ය හා සුබසාධන කටයුතු කෙරෙහිද රජය මෙන්ම රාජ්‍යනොවන ආයතනවල අවධානයයොමු විය.එසේම සේවා නියුක්ත කාන්තාවන්පෙ.ව. 7.30 වන විට සේවයට වාර්තා කළ යුතු අතර පස්වරු 4.30 වන විට දළු නෙළීම අවසන් කළ යුතුය. පිරිමි පාර්ශ්වය පෙ.ව. 7.30 වන විට සේවයට වාර්තා කළ යුතු අතර පස්වරු 12.30 වන විට සේවය අවසන් වේ. නව සාමූහික ගිවිසුමට අනුව මූලික දෛනික

වැටුප රුපියල් 500සිට රුපියල් 700 දක්වා රුපියල් 200කින් සහ මිල දර්ශන දීමනාවරුපියල් 30සිට රුපියල් 50 දක්වා රුපියල් 20කින් වැඩිකර ඇත. නමුත් මේ දක්වා කරන ලද පැමිණීමේ දීමනාව හා දිරි දීමනාව අහෝසි කර ඇත. ඒ අනුව වර්තමාන වතුකම්කරුවන්ට රුපියල් 750කට ආසන්න දෛනික වැටුපක් ගෙවනු ලැබේ. එය කාන්තාවන් හමුවේ වෙනස් විය හැකිය. තවද තේ වතු කම්කරුවන් කුටුම්භයන් තුළ තම වෘත්තියට අමතරව සත්ත්ව පාලනය, ගෙවතු වගාව හා තාවකාලික රැකියා සඳහා යොමු වී ඇත. පවුලේ ආදායම, ග්‍රාමීය හා වතු ප්‍රදේශවල ප්‍රමාණවත් නොවීමත්, වතු කම්කරු සේවක වැටුප් විෂමතාවයන් පවුල් ආර්ථිකයට මූලිකවම බලපාන අතර එයිනුත් වතුකර කාන්තාව බොහෝ පීඩාවන්ට පත්ව ඇත. ඔවුන් තුළ පාසල් හැරයාමේ ප්‍රවණතාවයත්, ළමා හා කාන්තා ශ්‍රමිකයන් බිහිවීමත් දැකිය හැකිය. (UNICEF Sri Lanka, 2013.)

එසේම වතුකර කම්කරු කාන්තාවන්තුළ විවිධ සමාජ දුර්වලතා පෙන්නුම් කරන අතර ඔවුන් සමාජ, දේශපාලනික, ආර්ථික හා ආගමික යන බොහෝ ක්ෂේත්‍රයන්ගෙන් තවමත් දියුණුවකට පත්ව නොමැත. විරැකියාව, දරිද්‍රතාවය මෙන්ම අනවශ්‍ය ලිංගික බලපෑම් ආදිය හේතුවෙන්ද ඔවුන් නිරන්තරයෙන් පීඩාවන්ට පත්ව ඇත. වතුකර කම්කරු කාන්තාවට මුහුණ දීමට සිදුවන සමාජ, ආර්ථික ගැටලු මොනවදයන්න සොයා බැලීම මෙම පර්යේෂණයේ පර්යේෂණ ගැටලුව වන අතර මෙහි අරමුණ වී ඇත්තේ,වතුකර කම්කරු කාන්තාවන්ට මුහුණ දීමට සිදුවන සමාජ, ආර්ථික ගැටලු හා එහි ස්වභාවයන් පිළිබඳව අවබෝධයක් ලබා ගැනීමයි. එහිදී වතුකර කම්කරු කාන්තාවන්ගේ පවුල් පරිසරය, ඔවුන්ගේ ආර්ථිකය මෙන්ම ආදායම හා වියදම කෙරෙහි ද වැඩි අවධානයක් යොමු කිරීමවැදගත් වේ. වර්තමානය වන විට විවිධාකාරයෙන් මෙම ප්‍රජාවන් ගැන පර්යේෂණ මෙන්ම අධ්‍යයනයන් සිදු කෙරුණදතවමත් නිසි ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බව එවැනි ප්‍රදේශ අධ්‍යයනය තුළින් හඳුනාගත හැකිය. ඒ අනුව කෑගල්ල දිස්ත්‍රික්කයේ බුලත්කොහුපිටිවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඉහල නෙව්ස්මියර් ග්‍රාමසේවා වසමේ යටිදැරිය වත්ත අධ්‍යයන ප්‍රදේශය ලෙස තෝරාගෙන ඔවුන් මගින් මෙම පර්යේෂණය සිදුකිරීම තුළින් වතුකර කම්කරු කාන්තාවට මුහුණදීමට සිදුවන සමාජ, ආර්ථික ගැටලු පිළිබඳව සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක් සිදුකිරීම මෙහිදී සිදුවේ.

**ප්‍රධාන අරමුණ**

වතුකර කම්කරු කාන්තාවට මුහුණ දීමට සිදුවනසමාජ, ආර්ථික ගැටලු හා එහි ස්වභාවයන් පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම.

**සුවිශේෂී අරමුණ**

වතුකර කම්කරු කාන්තාවට මුහුණ දීමට සිදුවන සමාජ, ආර්ථික ගැටලු වලට හේතු සාධක අනාවරණය කර ගැනීම.

**සාහිත්‍ය විමර්ශනය**

මෙරට සිදුවූ ඉඩම් ප්‍රතිසංස්කරණයට පෙරාතුව වතු කම්කරුවන්ගේ නිවාස, සෞඛ්‍ය, අධ්‍යාපනආදී පහසුකම් පිළිබඳව කිසිවෙක් ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොතිබුණත් ප්‍රතිසංස්කරණවලින් පසුවතුකම්කරුවන්ගේ මූලික පහසුකම් වර්ධනය කිරීමට කටයුතු යොදන ලදී. (පියරත්න, 2005).

තේ වතු ක්ෂේත්‍රයේ වැඩි පිරිසක් අධ්‍යාපනය ඉතා අඩු වයසක දී අවසන් කරයි. ඔවුනට ආහාර ප්‍රශ්නයකට විසඳුමක් සෙවීම පමණක් අරමුණ වන අතර අධ්‍යාපනය ලැබීමට යොමු නොවේ. පිරිමි දරුවන් මෙන්ම කාන්තාවන් දඅවු.15සහ අවු.16වන විට මුදල් ඉපයීමට උත්සාහ ගනියි. සේවාවේ ස්වභාවය අනුවවැටුප තීරණය වන අතර එය ඔවුන්ගේ පවුලේ වියදමට ප්‍රමාණවත් නොවේ.(ජයවර්ධන, 2008).

ඉතිරි කිරීම් හා ණය ගැනීම් යන අංශ ද්විත්වයට නොමැති කුටුම්භවැඩි ප්‍රතිශතයක් වතුකරය තුළ පවතී. විශේෂයෙන්ම ප්‍රධාන සාමාජිකයින් විශ්‍රාමික වූ පවුල්වලමෙම ලක්ෂණය දක්නට ලැබේ. සෙසුණය එදිනෙදා අවශ්‍යතා සඳහා ගත් ඒවාය. කාන්තා සමිතිද ක්‍රියාත්මක වී ඇත. වතුකර කාන්තාවන් තම පවුල් ආර්ථික තත්ත්වයේනභා සිටුවීමට විශාල මෙහෙයක් සිදුකරන අතරඔවුන්ගේ ආභරණ සුරක්ෂිතව තබා අවශ්‍ය අවස්ථාවලදීඋකස් කිරීම මගින් හදිසි මුදල් අවශ්‍යතාසපුරා ගනු ලබයි. ( ජයවර්ධන, 2008).

1995දී පැවැත් වූ සිව්වන ජාතික පෝෂණ හා සෞඛ්‍ය සමීක්ෂණය තුළින් අනාවරණය වූයේ වතු ආශ්‍රිතව වාසය කරන ගර්භණීමව්වරුන්ගෙන් 58.6% ක් සතුව BMI දර්ශකය 18.5 ට අඩුවෙන් පවතින බවයි. නියැදියෙහි ගර්භණී මව්වරුන්58.3% ක් නීරක්ති රෝගයෙන්පෙලෙන බව අනාවරණය වී ඇත.මේ අනුව හෙළිවන්නේ දළුනෙළීමේ කාර්යය සඳහා නීරක්තිය ඍජුවම බලපාන බවයි. නොසැලකිලිමත්කම, දරිද්‍රතාවය, දුර්වල ආහාර පුරුදු, අඩු අධ්‍යාපන මට්ටම මෙම රෝග ඇතිවීමට හේතුවන බවද මෙම සමීක්ෂණයන්ගෙන් අනාවරණය විය. (Selvarathnam & pathmeswaram,2003).

අනෙකුත් ග්‍රාමීය හා නාගරික ප්‍රදේශවලට වඩා වතු අංශයේ දරිද්‍රතාවය ඉහළ අගයක් තුළ පවතී. සාමාන්‍ය ජීවිතයක් ගත කිරීමට මාසයක් සඳහා අවශ්‍ය සාධාරණ ජීවන වැටුප සහ වර්තමාන වැටුප අතර පරතරයක් ඇති බව සඳහන් කළ හැකිය. සමහර තේ වතු වල ජීවන වැටුප අර්ධ වශයෙන් අවම කරන කරනු ලබන්නේ පොදු හා පෞද්ගලික ආකාරයේ වටිනාකම් ලබා දෙමිනි.

සමාජානුයෝජනය නමැති සංකල්පයද මෙම වතුකරු ප්‍රජාව තුළ දැකිය හැකිය. එනම් ඔවුන් සාමාන්‍ය සමාජයෙන් විශේෂිත වූ වතුකර සමාජයකට හැඩ ගැසී ඇති අතර ඔවුන්ගේ දරුවන්ට කුඩාකල සිටම එම පරිසරයට හා ඔවුන්ගේ ජීවන ක්‍රමයන්ට අනුගත වීම ඒ අනුව පෙන්වා දිය හැකිය.

සමාජයේ ඒ වන විට පැවති තත්ත්වයෙන් වඩා වෙනස් වූ තත්ත්වයකට වෙනස් කරලීම නැතහොත් හැඩගැසීමනවීකරණය ලෙස හඳුනා ගත හැකිය. නවීකරණය සිදුවනුයේ සමාජය සාම්ප්‍රදායික නොදියුණු තත්ත්වයක සිට දියුණුනවීන තත්ත්වයක් කරා වෙනස්වීමෙනි. මේ අනුව වතුකර ප්‍රජාව හා වතුකර කාන්තාව ගත් විට ඔවුන් ලංකාවට පැමිණෙන විටපැවති තත්ත්වයට වඩා වර්තමානය වන විට වාණිජකරණය හමුවේ සමාජය නවීකරණයට පත්වීම මත ඔවුන්ගේ සමාජ, ආර්ථික හා සංස්කෘතික හැඩගැස්වීම් බොහෝමයක් වෙනස් වී පැවතීමපෙන්වා දිය හැකිය.

**අධ්‍යයන ක්‍රමවේදය**

මෙම අධ්‍යයනය සඳහා ප්‍රාථමික හා ද්වීතීක යන දත්ත දෙවර්ගයම රැස් කරන ලදී. ප්‍රාථමික දත්ත ලබා ගැනීම සඳහා මූලිකවම ගැඹුරු සම්මුඛ සාකච්ඡා ක්‍රමය හා නිරීක්ෂණ යනද්විත්වය භාවිතා කළ අතරද්වීතීක දත්ත ලෙස මාතෘකාවට අදාළව සිදුකරන ලද පූර්ව පර්යේෂණ, ග්‍රන්ථ, වාර්ෂික වාර්තා යනාදිය භාවිතා කරන ලදී.

මෙම අධ්‍යයනයේදී නියැදි ක්‍රමය භාවිතා කළ අතරඑහිදී අරමුණු සහගත නියැදි ක්‍රමය භාවිතයට ගැනිණි. මෙම අධ්‍යයනයේ සිදුවූයේවතු කම්කරුවන් ලෙස තම රැකියාව සිදු කරන වතුකර කාන්තාවන් ආශ්‍රයෙනි. මෙම පර්යේෂණයේ අධ්‍යයන ප්‍රදේශය ලෙස කෑගල්ල දිස්ත්‍රික්කයේ බුලත්කොහුපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඉහළ නෙවිස්මියර් වසමට අයත් යටිදැරිය වත්ත නමින් හඳුන්වන වතුකර කම්කරුවන්ලෙස තම රැකියාව සිදුකරන්නන් බහුල දමිළ ජනාවාස පිහිටා ඇති ප්‍රදේශයක්තෝරා ගත්තෙමු.මෙම වතුකර ජනාවාස තුළ පවුල් 75ක් පමණ සංඛ්‍යාවක් ජීවත් වන අතර වතුකම්කරුවන් ලෙස තම රැකියාව සිදුකරන කාන්තාවන් සැලකිය යුතු ප්‍රමාණයක් සිටියි. ඒ අතරින් අප විසින් කාන්තාවන් පහළොස් දෙනෙකු තෝරා ගනිමින් අධ්‍යයනයට අවශ්‍ය දත්ත රැස් කිරීම සිදුකරන ලදී. අප විසින් ගුණාත්මක පර්යේෂණ සැලැස්මකට අනුව මෙම අධ්‍යයනයේ සිදුකළ අතර ගුණාත්මක දත්ත විශ්ලේෂණ ක්‍රමයක් වන තේමාකරණය හරහා දත්ත විශ්ලේෂණය සිදු කරන ලදී.

**විශ්ලේෂණය**

අධ්‍යන ක්ෂේත්‍රය තුළදී කාන්තාවන් යන කුලකය තුළ පූර්ණ කාලීන ගෘහණියන්, කුලී ශ්‍රමිකයන්, වයස්ගත යැපෙන්නන්, වතු කම්කරුවන් යනාදී උපකුලකයන් හඳුනාගත හැකි විය. අපගේ අධ්‍යයන ගැටළුවට අදාළ වූයේ වතු කම්කරු කාන්තාවන්ය. එනම් තමා අයත් ප්‍රදේශයේ තේ කර්මාන්ත ආයතනයට අනුයුක්තව කම්කරුවන් වශයෙන් කටයුතු කරන කාන්තාවන්ය.

අප විසින් අවධානයට යොමු කරනු ලැබූ ආර්ථික ගැටලු යන කරුණට අදාලව අපට හඳුනාගත හැකි ප්‍රථම ගැටලුව වූයේ වර්ෂ ගණනාවක් මුළුල්ලේ වතු ප්‍රජාවන් ආශ්‍රය කර ගනිමින් ප්‍රබල සමාජ ආර්ථික ගැටලුවක් ලෙස කතා බහට ලක් කරන දරිද්‍රතාවයෙන් වැඩි පීඩාවකට ලක්වන පිරිසක් වශයෙන් වතුකර කම්කරු කාන්තාව හඳුනා ගත හැකිවීමයි. අප විසින් අධ්‍යයනයට ලක් කළ බහුතර කාන්තාවන් ප්‍රමාණයකගේ පවුල් තුළ ඔවුන්ගේ සැමියන් එසේත් නැතහොත් තරුණ දූ දරුවන් ආර්ථික වශයෙන් යම් ඉපයීමක් සිදුකරන අය විය. එසේම අනෙකුත් වතුකර පවුල්වලට සාපේක්ෂව අප විසින් අධ්‍යයනයට ලක් කළ වතුකර කම්කරු කාන්තාව පවුල තුළ ආර්ථික උපයන්නියන් වශයෙන් කටයුතු කලද පෞද්ගලිකව ඇයට තම අවශ්‍යතාවයන් ප්‍රමාණවත් ආකාරයෙන් සපයා ගැනීමට හැකියාව ලැබී නොමැති බව අප රැස්කළ දත්ත හරහා පැහැදිලි විය. මීට ප්‍රධාන හේතුව ලෙස බහුතර කම්කරු කාන්තාවන් ප්‍රමාණයක් අදහස් කරනු ලැබුවේ ඔවුන්ගේ සැමියන් අධික බීමත්කමට ඇබ්බැහි වී සිටීමෙන් ඔවුන් තමා විසින් ලබන ආදායම තුළින් වැඩි කොටසක් මත් වතුර මිලදී ගැනීමට භාවිතා කරන නිසාවෙන් බවයි. එවැනි තත්ත්වයක් තුළදී තම පවුලේ වැඩි වියදම් ප්‍රමාණයක් තමා මත පැටවෙන බැවින් තම මූලික අවශ්‍යතාවයන් සපුරා ගැනීම පිළිබඳව ඔවුන්ට ආර්ථිකමය බාධාකයන් පැන නගින බව ඔවුන්ගේ දත්තයන් තුළින් හෙළි විය.

මෙම කාන්තාවන් වතුකර කම්කරුවන් වශයෙන් දිනයට අදාල තේ දළු කිලෝ ප්‍රමාණය නෙලාඅවසන් කිරීමෙන් අනතුරුව කුලී ශ්‍රමිකයන් ලෙස විශේෂයෙන් කුඩා තේ වතුවල සේවය කිරීමට පුරුදුව ඇත. උදැසන කාලයෙන් පසුව මොවුන් තේ දළු නෙළීම තේ වතු ශුද්ධ කිරීම යනාදී කටයුතු සඳහා තම ශ්‍රමය සපයනු ලබයි. මෙහිදී ඔවුන් යම් සැලකිය යුතු මට්ටමේ ඉපයීමක් සිදුකරන බව ඔවුන් ලබා දුන් දත්තයන් හරහා ගම්‍ය වුවද නමුත් දිනපතා මෙය සිදුකිරීමට අවස්ථා නොපවතින අතර කාලගුණ තත්ත්වයන් මත එය අපහසු කාර්යයක් බව ඔවුන් ප්‍රකාශ කළේය. හැකි සෑම අවස්ථාවකම දිනකට රැකියා ද්විත්වයක් සිදුකිරීමට ඔවුන් උත්සාහ කරනු ලබයි. එසේම ගෘහණියක් වශයෙන් නිවසේ වැඩ කටයුතු සිදු කිරීමට ද සිදුව ඇත්තේ ඇයටයි. මේ හා සම්බන්ධව හඳුනාගත හැකි වූ තවත් ගැටලුවක් වූයේ වැටුප් ගෙවීම්වල පවතින අසමානතාවයන්ය. විශේෂයෙන්වතුකර කම්කරු කාන්තාව කුලී ශ්‍රමිකයන් ලෙස සිදුකරන රැකියාවන්හිදී සමාන කාර්යයන් හා සමාන පැය ගණනක් තුළදී පුරුෂයන් හා

ස්ත්‍රීන්ට කරනු ලබන ගෙවීම් තුළ අසමානතාවයක් පවතී. සාමාන්‍යයෙන් දහවල් 12 සිට සවස 4 දක්වා සිදු කරනු ලබන කුලී වැඩ කටයුතු සඳහා පිරිමි පුද්ගලයකුට රුපියල් 900 හැක මුදලකුත් කාන්තාවන් සඳහා රුපියල් 750 ක පමණ මුදලකුත් වැටුප වශයෙන් ගෙවනු ලබයි. ස්ත්‍රී පුරුෂ සමාජභාවීමය වෙනස පදනම් කොටගෙන පුද්ගලයකුගේ ශ්‍රමය තක්සේරුවට ලක් කිරීමක් මෙහිදී සිදු කෙරේ. ජීව විද්‍යාත්මක වෙනස්කම් පදනම් කරගනිමින් සමාජය තුළ ගොඩනඟා ගෙන ඇති මෙම වෙනස හේතුවෙන් පුද්ගලයකු වශයෙන් තම හැකියාවන්ට,ශක්‍යතාවයන්ට නිසි ඇගයීමක් හෝ වටිනාකමක් ලබා නොදීම වර්තමානය වන විට වතුකර සමාජය තුළ පමණක් නොව නාගරික රැකියා පරිසරය තුළද දක්නට ලැබෙන්නකි. වතුකර කම්කරු කාන්තාව ආර්ථික උපයන්නියක් බවට පත් වූවත් ඔවුන් තුළින් මග නොහැරෙන දරිද්‍රතාවය හේතුවෙන් ඔවුන් මුහුණ දෙන විවිධ ස්වරූපය පීඩාකාරී තත්ත්වයන් ඔවුන් තුළින් දක්නට ලැබුණි. ප්‍රමාණාත්මක හා ගුණාත්මක ආහාර ලබා ගැනීමේ නොහැකියාව, ප්‍රමාණාත්මක පරිදි ඇඳුම් පැළඳුම් භාවිතයට ගැනීමේ නොහැකියාව ආදී මෙන්ම ගුණාත්මක සෞඛ්‍ය සේවාවන් මෙන්ම මානසිකව හා ශාරීරිකව අවශ්‍ය වන්නා වූ නිදහස හා විවේකය සම්බන්ධව ද ඔවුන් යම් දරිද්‍රතාවයකින් පෙළේ. ද්විත්ව භූමිකාවන් රඟ දක්වනු ලබන ඔවුන්ට පුද්ගලයකු වශයෙන් අවශ්‍ය ශාරීරික හා මානසික අවශ්‍යතාවයන් නොලැබීම හේතුවෙන් විවිධාකාරයේ මානසික හා කායික දුර්වල වීම්වලට ලක්වී ඇති ආකාරය අධ්‍යන ක්ෂේත්‍රයේදී ආවරණය විය. සෘජුවම මන්ද පෝෂණය වැනි රෝගී තත්ත්වයන් ඔවුන් තුළින් හඳුනා නොගත්තද නොනැවතින හිසේ වේදනාවන්, අස්ථි දුර්වල වීම්,උදරආම්ලික තත්ත්වයන් මෙන්ම මානසික පීඩනය වැනි රෝගී තත්ත්වයන් ඔවුන් තුළින් හඳුනාගත හැකි විය.

අප විසින් දත්ත දායිකාවන් ලෙස සම්බන්ධ කරගත් කාන්තාවන්ගෙන් වැඩි ප්‍රමාණයක් විවාහක කාන්තාවන් විය.ඔවුන් හා අප අතර සිදුකළ සාකච්ඡාවන්හිදී ලබාගත් දත්තයන්ට අනුව අපට හඳුනාගත හැකි වූ තවත් මාතෘකාවක් වූයේ වතුකර කම්කරු කාන්තාවන්ට තීරණ ගැනීමේ හා එම තීරණ ක්‍රියාත්මක කිරීමේ අයිතිය සම්බන්ධව ගැටලු පවතින බවයි. විවිධ සමාජ සංස්ථාවන් සමඟ කටයුතු කිරීමේදී මෙම තත්ත්වයන් හොඳින්ම නිරූපණය වන බව ඔවුන් ලබාදුන් දත්තයන් තුළින් අපට පැහැදිලි විය. උදාහරණයක් ලෙස එක් වතුකර කම්කරු කාන්තාවක් ලබා දුන් ප්‍රකාශයක මෙලෙස සටහන් විය .

“මම කැමැත්තෙන් හිටියා රට යන්න, වෙන රටකට ගිහිල්ලා සල්ලි මට මෙහෙ එවන්න පුළුවන්නේ, අපිට හොඳට ගෙදරක උනත් වැඩ කරගෙන ඉන්න පුළුවන්නේ, ඒ උනාට සෙල්වයි අම්මයි කැමති වුනේ නෑ ඒකට ඊට පස්සේ තමා මං වත්තේ දළුකඩන්න ගියේ”(හතරවන දත්ත දායිකාව)

මෙහිදී සෙල්වා නමින් ඇය හැඳින්වූයේ ඇයගේ ස්වාමිපුරුෂයාය. ඇය ශාරීරිකවත්,මානසිකවත් විදේශයට ගොස් ගෘහ සේවිකාවක් වශයෙන් කටයුතු කිරීමට සූදානම්ව සිටිය දී ඇයගේ තීරණයට හා අභියෝගයට මුහුණ දීමට ඇයට අවශ්‍ය නිදහස තමාගේ පවුල තුළින් නොලැබී තිබුණි. පවුල තුළ ප්‍රධාන භූමිකාවක් ඔවුන් විසින් මෙහෙයවනු ලැබුවාද ඊට අදාල තීරණ ගැනීමේ අයිතියක් ඔවුන්ට හිමිව නොමැත. එසේම ආර්ථිකමය වශයෙන් උපයන්නියක් වුවද එම ආර්ථික ඉපයීම් භාවිතා කිරීමේ අයිතිය පූර්ණ වශයෙන් ඔවුන්ට නොලැබී ඇත.පවුල තුළ පමණක් නොව අධ්‍යාපනය, ආගම ,විවාහය යන සමාජ සංස්ථා තුළද මෙම තත්ත්වය එලෙසම විවිධ ස්වරූපයෙන් ක්‍රියාත්මක වේ. ස්ත්‍රී පුරුෂ සමාජභාවීමය අසමානතාවය පදනම් කරගත් බල ගතිකත්වය මෙහිදී නිරූපණය විය. කාන්තාව යන චරිතය සමාජ පරිසරය තුළත් ස්ත්‍රී පුරුෂ සමාජභාවීමය වෙනස පදනම් කොට ගනිමින් පරම්පරාවෙන් පරම්පරාවට සම්ප්‍රේෂණය වන සංස්කෘතිමය රාමුගත කිරීමේ තත්ත්වයන් මෙයින් ගම්‍ය වේ.

වතුකර පවුල තුළද ගෘහ මූලිකයා ලෙස සලකනු ලබන්නේ පියා නොහොත් පිරිමි පුද්ගලයාය. එවිට ඉඩම් අයිතිය සම්බන්ධ ප්‍රධානියා වන්නේ ගෘහ මූලිකයාය. එසේත් නැතහොත් දැනට පදිංචිව සිටින පුද්ගලයාගේ පියා බොහෝ විට ඉඩමට හිමිකම් කියනු ඇත. කාන්තාවට මූලිකත්වය හෝ ඉඩම් අයිතිය ලැබෙන්නේ ඉතා කලාතුරකිනි. බොහෝ විට ඉඩම් සම්බන්ධව පවතින්නේ පරම්පරාවෙන් පැවත ගෙන එන්නා වූ අයිතියකි. මෙයට හේතු සාධක ලෙස සමාජ ආකල්ප, කාන්තාවන්ට මේ පිළිබඳව පවතින අඩු දැනුවත්භාවය, උනන්දුවක් නොමැතිකම මෙන්ම ඉඩම් අයිතිය හිමිකර ගැනීම සම්බන්ධව කටයුතු කිරීමේදී සිංහල භාෂාව භාවිතා කිරීමට සිදුවීම,ස්ත්‍රී පුරුෂ සමාජභාවීමය වෙනස පදනම් කරගනිමින් ස්ත්‍රියට හිමි සමාජ පිළිගැනීම හා බලයේ පවතින හීනතාවය යනාදී හේතු සාධකයන් ඔවුන්ගේ දත්තයන් තුළින් පැහැදිලි විය. වර්තමානයේ ඔවුන් අනුයුක්තව සේවය කරනු ලබන තේ කර්මාන්ත ශාලාව තුළින් ඔවුන්ගේ අර්ථසාධක හරහා ණය යෝජනා ක්‍රමයක් මගින් පවුල් කිහිපයකට වතුකර ප්‍රදේශය තුළම ඉඩම් හා නිවාසඉදිකිරීමට ණය ලබාදීමේ ව්‍යාපෘතියක් සිදු කරනු ලබයි. එහිදී එය ලබා දී ඇත්තේ ගෘහ මූලිකයාගේ නමින් වන අතර කාන්තාව පමණක් තේ කර්මාන්ත ශාලාවේ නිත්‍ය සේවකයකු ලෙස කටයුතු කරන පවුල් වලටද මෙය ණය ව්‍යාපෘති වැඩසටහන හරහා මුදල් සහ ඉඩම් ලැබී තිබුණු අතර නිවාස ඉදිකිරීමෙන් අනතුරුව ඒවායෙහි අයිතිය සඳහන් කර තිබුණේ ගෘහ මූලිකයා වන පුරුෂයාගේ නමිනි. නමුත් දෙනු ලැබූ ණය සහ අනෙකුත් ආධාරවලට අදාල වැටුප් කපා ගැනීම් සිදුකරනු ලබන්නේ කාන්තාවගේ නමිනි. මෙම අවස්ථාවේදී ස්ත්‍රී පුරුෂ සමාජ භාවීමය වෙනස ඉතා සූක්ෂමව ක්‍රියාත්මක වන ආකාරය දක්නට ලැබේ.

ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය පුද්ගලයන්ට සහ පවුල්වලට විනාශකාරී බලපෑම් ඇති කළ හැකි බරපතල ප්‍රශ්නයකි. යම්කිසි පුද්ගලික සම්බන්ධතාවයක් මත පදනම්ව එක් අයෙකු විසින් තවත් අයෙකුට ශාරීරික වශයෙන්, මානසික වශයෙන්, ලිංගික වශයෙන්, ආර්ථික වශයෙන් හෝ තාක්ෂණික වශයෙන් පීඩාවට පත්කිරීම එසේත් නැතහොත් හිංසා කිරීම ප්‍රචණ්ඩත්වය පැම ලෙස පෙන්වා දිය හැකිය. කාන්තාවගේ ජීවිතය තුළ ඇය පීඩාවට ලක් කරනු ලබන තවත් ගැටළුවක් ලෙස අපට හඳුනාගත හැකි වූ ගෘහස්ථ ප්‍රචණ්ඩකාරී තත්ත්වයන් වතුකර කම්කරු කාන්තාවටද එලෙස පවතින ආකාරය ආනුභවික දත්තයන් හරහා හඳුනාගත හැකි විය. දිනපතා තම ස්වාමියා විසින් සිදුකරන ශාරීරික මානසික පීඩාවන්ට මුහුණ දෙනු ලබන කාන්තාවන් ඔවුන් තුළින් හඳුනාගත හැකි විය ස්ත්‍රීත්වය හේතුවෙන් මෙලෙස විරුද්ධ පාර්ශවය හිරිහැර විඳීම් තුළින් විවාහක ජීවිතය පීඩාවක් බවට පත් වූ කාන්තාවන්ගේ අත්දැකීම් බෙදා ගැනීමට අපට මෙහිදී අවස්ථාව ලැබුණි ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට අදාළ නෛතික ප්‍රතිපාදන 2015 අංක 34 දරන ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියා වැළැක්වීමේ පනතේ ඇතුළත් වේ. මෙම පනතේ දක්වා ඇති ප්‍රතිපාදන ප්‍රකාරව ගෘහස්ථ හිංසනයට ලක් වූ පුද්ගලයින් හට නීතියේ පිහිට පැතීමට අවස්ථාව සලසා දී ඇතත් වතුකර කාන්තාවන්ට ඒ පිළිබඳව පවතින අඩු දැනුවත්භාවය,නොසැලකිල්ල හා විරුද්ධ පාර්ශවයන් කෙරේ පවතින බිය මෙන්ම කාරුණික භාවය මෙය වැළැක්වීම සම්බන්ධව පවතින බාධකයන් විය.

වතු කම්කරු කාන්තාවගේ සුරක්ෂිතතාවය උදෙසා ක්‍රියාත්මක වන වතුකම්කරු සංගම් තුළ වතුකම්කරුවන් ලෙස රැකියාව සිදු කරන සියලුම දෙනා ලියාපදිංචි කර ඇත. නමුත් මේ පිළිබඳව විශේෂයෙන් කම්කරු කාන්තාවන්ගේ දැනුවත්භාවය ඉතා අඩු මට්ටමක පවතින බව ක්ෂේත්‍රය තුළදී අපට පැහැදිලි වූ කාරණාවකි. සාකච්ඡා රැස්වීම් ආදියට කාන්තාවන්ගේ සහභාගිත්වය ඉහළ අගයක පැවතිය ද තනතුරු දැරීම, අදහස් ප්‍රකාශ කිරීම යනාදී කරුණු කාරණාවන්හිදී ඔවුන් පුරුෂයින්ට වඩා පිටුපසින් සිටී, කම්කරු සංගම් තුළ ඉහළ ධූරයන් පුරුෂාධිපත්‍යයට යටත්ව ඇත, ඒ හේතුවෙන් ගනු ලබන තීරණ පුරුෂාධිපත්‍යයට පක්ෂපාතීත්වය දරණ තීන්දු තීරණ වීමට වැඩි ඉඩකඩක් පවතියි. මේ නිසාවෙන් ඔවුන්ට එහි නිත්‍ය ප්‍රතිඵල ලබා ගැනීමට නොහැකි වී ඇත.

වතුකර කම්කරු කාන්තාව සම්බන්ධව අධ්‍යයනය තුළින් හඳුනා ගනු ලැබූ සමාජ-ආර්ථික ගැටලු මෙන්ම එහි ස්වභාවයන් සහ එම ගැටලු ඇතිවීමට බලපානු ලැබූ හේතු සාධකයන් යන කරුණු කාරණාවන් පිළිබඳව ඉතා ගැඹුරින් සිදුකළ සොයා ගැනීම පිළිබඳව අවධානය යොමු කිරීමේදී තවමත් එලදායි විසඳුම් නො ලද වසර ගණනාවක් මුළුල්ලෙහි ඔවුන් හා සමීප සමාජ-ආර්ථික ගැටලු හා සම්බන්ධිත තේමාවන් හඳුනාගැනීමට ලැබුණු අතර ආනුභවික දත්ත ආශ්‍රයෙන් සිදු කරනු ලැබූ විශ්ලේෂණයන් තුළින් මෙම සමාජය තුළ අඩු වැඩි වශයෙන් ස්ත්‍රී

පුරුෂ සමාජභාවය මත පදනම්ව සිදුකරන වෙනස් කොට සැලකීම්, කාන්තාව බලගැන්වීම් සම්බන්ධව ගැටලු අදෘශ්‍යමාන හස්තයක්ව ක්‍රියාත්මක වන බව නිගමනය කළ හැක.

**නිගමනය**

අධ්‍යන ක්ෂේත්‍රය තුළින් රැස්කර ගත් දත්ත විශ්ලේෂණයෙන් දරිද්‍රතාවයෙන් වැඩි පීඩාවකට පත්වීම, ශ්‍රමයට නිසි මූල්‍යමය තක්සේරුවක් නොලැබීම වැනි ආර්ථික ගැටලු මෙන්ම තීරණ ගැනීමේ හා එම තීරණ ක්‍රියාත්මක කිරීමේ අයිතීන් පිළිබඳ ගැටලු, ඉඩම් අයිතිය සහ දේපල අයිතිය තහවුරු කරගැනීමේ අභියෝග වලට මුහුණ දීමට සිදුවීම, ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට ලක්වීම, කම්කරු සංගම් තුළ තීරණ ගැනීමේ ක්‍රියාවලීන් සඳහා කාන්තාව සීමිත නියෝජනයක් පෙන්නුම් කිරීම වැනි සමාජ ගැටලුවලට වතුකර කම්කරු කාන්තාව මුහුණ දෙන බවත්, එම ගැටලුව ඔවුන් තුළින් තුරන් කිරීමට අපහසු ස්වභාවයක් උසුලන බවත් එම ගැටලු ඇතිවීමට මෙන්ම තීව්‍රතභාවයට පත්කිරීමට, ස්ත්‍රී පුරුෂ සමාජ භාවීමේ අසමානතාවය අදෘශ්‍යමාන හස්තයක්ව වතුසමාජය තුළ ක්‍රියාත්මක වන බව නිගමනය කළ හැක.

**මූලාශ්‍ර**


Mathavam, M. (2023, February 28). *Status of female workers in plantation - colombo telegraph.* Colombo Telegraph. https://www.colombotelegraph.com/index.php/status-of-female-workers-in-plantation/

Kalyani, S. (2018, February 4). කඳුකර ස්ත්‍රියගේ පීඩාව. *Jesus Today Sri lanka.* https://www.jesustoday.lk/index.php/2018-02-04-07-18-09/1455-2020-11-12-05-40-38?

BBC News සිංහල. (2023, December 4). වසර දෙසීයකට පසුව වතුකම්කරු ප්‍රජාව සඳහා පළමුවරට තැපැල් ලිපියක් නිකුත් කෙරේ. https://www.bbc.com/sinhala/articles/cxe7l8k0038o

පියරත්න, ඒ.(2005). වතු කම්කරුවා සහ වෙනස්වන ජීවනරටාව,විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය, මුල්ලේරියාව.

බණ්ඩාර,බී.ජී.ටී.ඩී.තේවතු කම්කරු කුටුම්භවල ආර්ථික පසුබිම පිළිබඳ අධ්‍යයනයක්.සමාජ සංඛ්‍යානයඅධ්‍යයන අංශය. කැලණිය විශ්ව විද්‍යාලය.http://repository.kln.ac.lk/jspui/handle/123456789/22437